

# ඇත්තෙන්ම බෞතීස්මයක් අවශ්‍ය වන්නේ ඇයි?

- ජේම්ස් සහ ඩෙබ් ෆ්ලින්ට් -

**[Why Baptism Really Matters]**

# ඇත්තෙන්ම බෞතීස්මයක් අවශ්‍ය වන්නේ ඇයි?

- ජේම්ස් සහ ඩෙබී ෆ්ලින්ට් -

# පටුන


| | |
|---|---|
| අප ගැලවීම සඳහා කල යුත්තේ කුමක්ද ? | 3 |
| "ජලයෙන් ඉපැදීම" | 3 |
| අපොස්තුලුවරුන් කල දේ | 4 |
| කොරනේලියස් | 5 |
| අප ගැලවීම ලැබිය හැක්කේ කෙසේද ? | 6 |
| යේසුස්වහන්සේගේ මරණය | 7 |
| දෙවියන්වහන්සේගේ නියමයන් | 8 |
| පසු තැවීම හා හැරී ඒම | 9 |
| වැලලී ................ නැගිටීම | 10 |
| අළුත් ජීවිතයක් | 12 |
| ශුද්ධ ලියවිලි වලට එරෙහි ළදරු බෞතිස්මය | 13 |
| දෙගිඩියාවන් | 13 |
| දෙවියන්වහන්සේගේ අණ | 14 |
| වරප්‍රසාදය | 15 |
| ප්‍රශ්න | 16 |

# ඇත්තෙන්ම බෞතීස්මයක් අවශ්‍ය වන්නේ ඇයි?

## අප ගැලවීම සඳහා කල යුත්තේ කුමක් ද?

"ඔබ බෞතීස්ම ගැන කරදර වන්නේ ඇයි? එය උත්සවයක් පමණක් නොවේද? පල්ලියේ පූජකයා විසින් බිළිඳෙකුගේ හිසට ශුද්ධ දිය බිඳු කිහිපයක් ඉසීම හෝ දියේ ගිලීමක් ස්නානයක් මගින් කල හැකි වෙනස කුමක්ද? ඔබ කාලය නාස්ති කරනවා" යැයි බොහෝදෙනා අද කියනවාට සැකයක් නැත.

කෙටි පිළිතුර වන්නේ ජේසුස් වහන්සේ උන් වහන්සේගේ මුවින් හා අපෝස්තුලුවරුන් මගින් බෞතිස්මය පිළිබඳ කියන ලද දේ නව ගිවිසුමේ බොහෝ සේ ඇතිය යන්නයි. පැහැදිලි කරුණ වන්නේ අපට ජේසුස් වහන්සේ ගැන දැන ගැනීමට උන්වහන්සේ ඉගැන් වූ දේ දැනගැනීමට ඔහුගේ අනුගාමිකයන්ට කිරීමට අණකල දේ දැන ගැනීමට අපට අවශ්‍ය නම් අප පිළිතුර සඳහා බයිබලයට යා යුතුය. මේ පිළිබඳ සුදුසු උපදේශයක් සඳහා තනි පුද්ගලයෙකුගෙන් හෝ දේවගැති සභාවලින් ලබා ගත නොහැක. බෞතිස්මය ගැන බයිබලය අපට පවසන දෙය ඉතා වැදගත් වනු ඇත. බෞතිස්මය අපේ ජීවිතයට අත්‍යවශ්‍ය බවට බයිබලයේ කියා ඇත්තේ මොනවාද, යේසුස් වහන්සේ හා උන්වහන්සේ තෝරා ගත් අපෝසතුලුවරු විසින් එලිදරව් කරඇති කරුණු මොනවා දැයි අපි සොයා ගත යුතුවෙමු.

ඒ සඳහා ඇත්තෙන්ම වැදගත් ප්‍රශ්නය විය යුත්තේ ජේසුස් වහන්සේ උගන්වා අණ කලේ කුමක්ද? එහි ප්‍රතිඵලය වශයෙන් ඔහුගේ අපොස්තුලුවරු කලේකුමක්ද? යන්නය.

## "ජලයෙන් ඉපැදීම"

රාත්‍රියේ ජේසුස් වහන්සේ ළඟට පැමිණි යුදෙව් නායකයෙකු වන නිකදේමුස්ට උන්වහන්සේ කීවේ "මිනිසෙකු නැවත නූපන්නොත් ඔහුට දෙවියන් වහන්සේගේ රාජ්‍ය දැකිය නොහැක." යනුවෙනි. නිකදේමුස් මේ වචන පද යථාර්ථයෙන් ගත් කල්හි ජේසුස් වහන්සේ තවදුරටත් ඔහුට

විස්තර කලේ, "මිනිසෙකු දියෙන් හා ආත්මයෙන් නැවත නුපන්නොත් ඔහුට දෙවියන් වහන්සේගේ රාජ්‍යයට ඇතුල් විය නොහැක" කියාය. (යොහාන් 3: 3-5) නමුත් "ඔහු මිනිසෙකු දියෙන් ඉපදුනහොත්.............." යනුවෙන් කිවේ එය පැහැදිලිව බෞතිස්මය සම්බන්ධව නිසා නො වේද? යොහාන් බෞත්ස්ම ක්‍රියාවලිය පසුතැවීම ගැන දේශනා කරමින් බොහෝ දෙනා ජෝර්දාන් නදියේ බෞතිස්ම කලේය. ජේසුස් වහන්සේ ,ඔහුට උත්තර දෙමින් "දැනට ඉඩ හරින්න. මක්නිසාද, මෙසේ සියලු ධර්මිෂ්ඨකම් සම්පූර්ණ කරන්ට අපට සුදුසු යැයි කී සේක." (මතෙව් 3:15) "මිනිසෙකු දියෙන් නුපන්නොත් .................." යනුවෙන් ඔහු කියන්නේ මිනිසෙකු හෝ ස්ත්‍රියක ඒ රාජ්‍යයට අතුල්වීමට බෞතිස්ම විය යුතුය යන්න බවට සැකයක් නැත.

උන් වහන්සේ ස්වර්ගයට ඔසවා ගනු ලබන විට උන් වහන්සේගේ ශිෂ්‍යන්ට දුන් අණ කිරීම් මගින් මෙය තහවුරු වේ.

"එබැවින් නුඹලා ගොස් සියළු ජාතීන් ගෝලයන් කරන්න. පියාණන්ගේ පුත්‍රයාණන්ගේත් ශුද්ධාත්මයාණන්ගේ නාමයට බෞතිස්ම කරන්න." මා විසින් නුඹලාට අණකල සියල්ල පවත්වන්ට ඔවුන්ට උගන්වන්න. (මතෙව් 28: -19-20) ජේසුස් වහන්සේ ස්වර්ගයට ඔසාවා ගැනීමෙන් පසුව අපෝස්තුලුවරුන්ගේ වැඩ කොටස වූයේ බෞතිස්මය ඇතුළුව උගැන්වීම කරන ධර්ම දූත සේවයකි.

## අපොස්තුලුවරුන් කල දේ

නමුත් අපෙස්තුලුවරු මේ උපදෙස් ක්‍රියාත්මක කිරීම තේරුම් කලේ කෙසේද? ඔවුන්ගේ මහත් විස්තරාත්මක කටයුතු පිලිබඳ ක්‍රියා පොතේ දත්ත ඉතා වැදගත්ය. අපි ඒවා සැකෙවින් විමසා බලමු.

2: 36-38 පේදුරු ,පෙරුසෙලමේ ඔවුන්ගේ පිරිසට ඔවුන් ජේසුස් වහන්සේ "ස්වාමීන් වහන්සේගේ සහ ක්‍රිස්තුස්" ඇණ ගැසීම ගැන කීවිට ඔවුහු කලඹන ලද සිත් ඇතිව" අප කල යුත්තේ කුමක් ද? කීහ. පේදුරු පැහැදිලිව පිළිතුරු දෙමින් "නුඹලා සියල්ලෝ පැසුතැවීම පව්සමාව පිණිස ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමයෙන් බෞතිස්මය ලබන්න." 2-41

ඔවුහු ප්‍රතිචාර දැක්වූ හැටි අපට කියා ඇත. "ඔහු ඔහුගේ වචනය සතුටින් පිළිගෙන බෞතිස්ම කරනු ලැබූවෝය."

8-12 පිලිප් සමාරියෙහි. සුභාරංචි දේශනාකලේය. "ඔවුහු දෙවියන් වහන්සේගේ රජ්‍යයද, ජේසුස් වහන්සේගේ නාමයද, ගැන සුභාරංචිය

දේශනාකල පිලිප් විස්වාසකොට පුරුෂයෝද, ස්ත්‍රීහුද, <u>බෞතිස්ම</u> කරනු ලැබූවෝය."

8-39 යේසුස් වහන්සේගේ ශුද්ධ ලියවිලි සම්පූර්ණ කිරීමට අර්ථය අසා ඉතියෝපියානු නපුංසකයා ඉතාම සැලකිල්ලෙන් ඇසුවේ, "මම <u>බෞතිස්ම</u> ලැබීමට ඇති බාධා සීමා කුමක්ද?".............. කියාය. පිලිප් ද නපුංසකයා ද දෙදෙනාම වතුරට බැස ඔහු බෞතිස්ම කලේය.

<u>බෞතිස්ම</u> වීමේ තේරුම හා අත්‍යවශ්‍ය බව පිලිප් නපුංසකයාට කියාදීමෙන් ඔහු මේ ප්‍රශ්නය නැගුවා විය යුතුය.

9-18 තාර්සස් හි සාවුල් උත්තානය වූ ජේසුස් වහන්සේ දුටු විට අන්ධ බවට පත්ව විශ්වාසී අපොස්තුළුවරුයෙකු වූ අනානියස්ගෙන් හමුවීම ලබා අනානියස් ගේ වචන ඇසූවිට "එකෙනෙහිම ඔහුගේ ඇස් වලින් කොරපොතු වැන්නක් වැටී ඔහු පෙනීම ලැබූවේය. ඔහු නැගිට <u>බෞතිස්ම</u> කරනු ලැබූවේය."

16: 14-15 "දෙවියන් වහන්සේට වන්දනා" කල ලිඩියා, පාවුල්ගේ දේශනයට උනන්දුවී "<u>බෞතිස්මය</u> ලැබූවේය." 16 : 30-33

පිලිප්හි සිරගෙදර නිලධාරියා පාවුල්ගේ දේශනය ඇසූ ගමන් "ගැලවීම සඳහා මා කළ යුත්තේ කුමක්ද?" කියා කෑ ගැසීය. පාවුල් හා සීලස් ස්වාමීන් වහන්සේගේ වචනය ඔහුට කීවේය. ප්‍රතිඵලය ලෙස ඔහු <u>බෞතිස්ම</u> ලැබීය.

19:3-5 එපීසයේදී යොහාන් බෞතිස්තගේ බෞතිස්මය පමණක් දත් විශ්වාසිකයන්ගෙන් ස්වල්පයක් පාවුල්ට පැමිණ පසු ඔවුනට විස්තර කරමින්,

"එසේ වී නම් නුඹලා මොන බෞතිස්මයක් ලැබූවාදැයි" ඔහු ඇසුවේය. "යොහාන්ගේ බෞතිස්මය යැයි" ඔවුහු කීවෝය. පාවුල් කතා කොට "යොහාන් පසුතැවිල්ලේ බෞතිස්මයෙන් බෞතිස්ම කොට සෙනඟට කථා කරමින් තමාට පසුව එන තනැන්වහන්සේ කෙරෙහි" එනම් යේසුස් වහන්සේ කෙරෙහි අදහන්නා ලෙස සෙනඟට ඒවියැයි කීවේය. ඔවුහු ඒ සඳහා ස්වාමිවූ යේසුස් වහනසේගේ නමට බෞතිස්මය කරනු ලැබූවෝය."

## <u>කොරනේලියස්</u>

(ක්‍රියා 10) හි කොරනේලියස්ගේ සිදුවීම හොඳින් කල්පනා කර, මේ ලැයිස්තුවෙහි අගට යෙදීමට තබන ලද්දේ අද කාලයේ අප හට වඩාත්

වැදගත් වූ සැලකිය යුතු කරුණු රැසක් එහි අන්තර්ගත වෙයින. ඔහු ඊශ්‍රායල් දෙවියන් වහන්සේ හඳුනාගත් උන් වහන්සේට වන්දනා කල රෝමානු සොල්දාදුවෙකි. "ඔහු භක්තිමත් නිතර දන් දුන් නිත්‍ය වශයෙන් දෙවියන් වහන්සේට යාඥාකල අයෙකි. (පදය 2)

දෙවියන්ට වන්දනා කල යහපත් ක්‍රියා වල යෙදුණ නිතර යාඥාකරන හොඳ මිනිසෙකු වූ ඔහුට ඇත්තෙන්ම යම් කිසිවක් අවශ්‍ය විද? වාර්තාව අපට පෙන්වන්නේ ඔහුට අවශ්‍ය වූ බවයි. අපෝස්තුලු පීටර් හට ඔහු හමු වීමට අණ ලැබී ඔහුව දැනුවත් කර සිටියේ "නුඹට ගැලවීම පිණිස ඇති වචනය (11:14) වන දෙවියන් වහන්සේ ක්‍රිස්තුස් වහන්සේ තුල කල ක්‍රියාව වන, "යමෙක් ඔහු තුල විශ්වාස කරන්නේ නම් පව් සමාව ලබනු ඇත" යනුවෙනි. (10-43)

පේදුරු මේ ගමන සඳහා යාමට අකමැතිවිය. ඔහුගේ සහායකයින්ද අකමැති විය. අකමැති වූ හේතුව යුදෙව්වන් වූ ඔවුහු යුදෙව් නොවන අන්‍ය ජාතියක් විශ්වාසින් ලෙස ඇතුලත් කර ගැනීමට අපක්ෂපාතිව නොසිටීමය. දෙවියන් වහන්සේ පේදුරුගේ තත්වය නිසා ඔහුට දර්ශනයක් ඇතිවීමට සැලැස්විය. (පදය 9-16) "දෙවියන් වහන්සේ ශුද්ධ ලෙස සැලකුදෙය ඔහු අශුද්ධ ලෙස නොසැලිකය යුතුය." යන්න ඉගැන්වීම විය. කොරනේලියස් පේදුරු විසින් දේශනා කල වචන විශ්වාස කල විට, යුදෙවියන්ට තවත් විවාද නොකිරීමට සලකුණක් වශයෙන් "ශුද්ධාත්මය වචන ඇසූ සියල්ලන් කෙරෙහි" පහල විය. (පදය 44) ඒ යුදෙව්වන් ඉදිරියේ පුදුමයකට කරුණක් විය" ඒ යුදෙව්වන්ට නිසැක සාක්ෂි වශයෙන් දුන් විශේෂ දීමනාවක් වූ අතර බලාපොරොත්තුව වූයේ දෙවියන් වහන්සේ අන්‍ය ජාතින් විශ්වාසය තුලට ගැනීමට කමැති බව පෙන්වීමටය. පේදුරුගේ ප්‍රතික්‍රියාව මහත් සේ උපදේශණාත්මකය. "බෞතිස්ම කරනු ලැබීමට වතුර තහනම් කරන්නට පුළුවන් කාටද?.......... ඔවුහු <u>බෞතිස්ම</u> කිරීමට අණ කලේය." (පද 47-48)

ඉතාමත් කාවදින කරුණ වන්නේ කොරනේලියස් හා ඔහුගේ පවුල, ශුද්ධාත්වය ලද මුත්, පේදුරු ඔවුන් බෞතිස්ම කිරීමට අණ කිරීමයි. මෙහිදී බෞතිස්මයේ අත්‍යවශ්‍යභාවය සඳහා මීටත් වඩා සාක්ෂියක් තිබිය හැකිදැරු බෞතිස්මය යනු පිටතින් ගත සෝදාහැරීමක් නොව ගැලවීම සඳහා ඇති අර්ථවත් පියවරක් බව එයින් පෙනියයි.

## <u>අප ගැලවීම ලැබිය හැක්කේ කෙසේද?</u>

මතුපිටින් පෙනෙන ලෙස ප්‍රශ්ණය විසඳිය නොහැකි බව පෙණේ. එහි පැහැදිලිව පෙනෙන බාධාව නම් ස්ත්‍රීන්ට හා පුරුෂයන්ට දෙවියන්

වහන්සේ විසින් පෙන්වන ලද ක්‍රමයට ජීවිත ගත කිරීමට නොහැකි වීමය. බයිබලය මේ දුබලකමට කියන්නේ "පාපය" කියාය. එයට අප ඉඩ නොදිය යුතු වචනයක් වන්නේ එය ජනප්‍රිය නොවන නිසාත් අප එයට අකමැති නිසාත් නොවේ" මිනිසුන්ගේ දුබලතාවයන් ගැන පාපය ලෙස දෙවියන් වහන්සේ සඳහන් කරයි. පැරණි ගිවිසුමේ ඔහුගේ ප්‍රොපේතවරු එය ඊශ්‍රායල්ගේ අකීකරු කම යනුවෙන් සඳහන් කරයි. නව ගිවිසුමේ යේසුස් වහන්සේ හා අපෝස්තුලුවරු එය සඳහන් කරයි. මිනිස් පාපය ගැන කරුණු දෙවියන් වහන්සේ අපට දුන් පණිවිඩයේ පැහැදිලිව පෙන්නුම් කරන අතර , එය පිසදමා, එය කරුණක් නොවේ යැයි කිව නොහැක. දෙවියන් වහන්සේ එය ඉතා බරපතල ලෙස සලකන බවට කිසිදු සැකයක් නැත.

තව දුරටත් මිනිසාගේ ගැලවීම සඳහා ඉතා මහත් බාධාවක් වශයෙන් ඔවුන්ගේම පාපය පෙන්වා ඇතත් ඔහුගේ වචනය අසා එයට කීකරු වන්නන්ට පාපය ඉවත්කරගත හැකි බව පෙන්වයි. ඔහු එය පළමුවෙන් කලේ නාසරෙත්හි යුදෙව් ස්ත්‍රියක් වූ මරියා මගින් ශුද්ධාත්මයේ බලයෙන් උන් වහන්සේගේ පුතු උපදින්නට සැලැස්වීමයි. මේ කාරණය ලූක් සුභාරංචියේ පැහැදිලිව පෙන්වයි. "ශුද්ධාත්මයාණන් නුඹ කෙරෙහි පැමිණෙන සේක. මහෝත්තමයාණන්ගේ අනුභාවයද නුඹ වසා ගන්නේය. එනිසා නුඹට උපදින්නට සිටින තැනැත්තා ශුද්ධය දෙවියන් වහන්සේගේ පුත්‍රයායි කියනු ලබන සේක." (1:35)

දෙවියන් වහන්සේ ඔහුගේ පුත්‍රයා මෙසේ මිනිස් මවක් තුලින් ඉපදීමට ඉඩ සැලසූ නියම හේතුව දේව දූතයා යෝසප්ට කීවේ,

"උන්වහන්සේට යේසුස් යන නාමය තබන්න. මක්නිසාද ඔහු ඔහුගේ සෙනග පාපයෙන් මුදන්නේය. (මතෙව් 1:21)

## <u>යේසුස් වහන්සේගේ මරණය</u>

මෙය "පාපයෙන් ගලවා ගැනීම" යැයි අදහස් කරන්නේ කෙසේද? මේ සජීවී ප්‍රශ්නයට පුදුමසහගත පිළිතුරක් උන්වහන්සේගේ ජීවිතය හා චරිතයේද, අන්තිමේ දී කුරුසිය මත මරණයේද ඇත්තේය. උන්වහන්සේගේ චරිතය ගැන කල්පනා කිරීමේදී නව ගිවිසුම යේසුස් වහන්සේගේ ස්වභාවය අපට වාර්තා කරන්නේ එය අපේ ස්වභාවයට අතිශයින් සමාන ලෙසය. සත්තකින්ම උන්වහන්සේට තම මවගේ ස්වභාවය - මාංසය - තිබුනි. හෙබ්‍රෙව්වරුන්ට යැවූ ලිපියේ සඳහන් වන්නේ ඔහු "ලේ හා මස්" වලින් අපට සමාන බවය. (2:14) එහි අදහස ඔහු සියළු පාර්ශව වලින් අපේ අද්දැකීම් හා සම විය යුතු බවය. හෙබ්‍රෙව් වරුන්ට ලියූ මේ ලිපිය මෙසේ කියන්නේ ඒ නිසාය.

"උන්වහන්සේ පරීක්ෂා කරනු ලැබ දුක් වින්ද බැවින් ............ ඔහු සියළු කරුණු වලින් අප මෙන් වූ මුත් පව් රහිත විය." (2:18,4:15) එය පැහැදිලිව කිවහොත් යේසුස් වහන්සේගේ මිනිස් ස්වභාවයට සාමාන්‍ය වූ සියළු හැඟීම් වලින් විය යුතුය. ඔහු ඔහුගේ සතුට සඳහා පොළොඹවනු ලබන තමාගේ සැප පහසුව සොයන, තමාගේ සියළුම ශාරීරික උවමනාවන් සොය, තමාගේ අහංකාර කම දරා සිටින පොහොසත් හා බලවත් වීමට ආශා ඇතිකරන ස්වභාවය විය. නමුත් ඔහු මෙතෙක් ජිවත් වූ සියළු ස්ත්‍රීන් පුරුෂයන් මෙන් නොව තමාගේ ස්වභාවික ආශාවන්ට යටත් නොවිය. ඔහු ඒවා ප්‍රතික්ෂේප කර තමාගේ අතිමහත් විස්වාසය හා කිකරු කම දෙවියන්ට පෙන්විය.

මෙහි වැදගත් කම ඉතා විශාලය. හේතුව ඉතිහාසයේ ප්‍රථම වරට මිනිසෙකු පාපය පරාජය කලේය. මිනිස් ස්වභාවයේ රජ කරන පාපය එහි ආධිපත්‍ය පවත්නා භූමිකාවෙන් පරාජය කරන ලදි. මිනිසුන් විසින් කල නොහැකි දෙය ක්‍රිස්තුස් වහන්සේ ලබා ගත් සේක. පව්න් තොර මිනිස් සංහතියේ සාමාජිකයෙකු වූ උන් වහන්සේට, "ලෝකයේ පාපය දුරු කරන දෙවියන් වහනසේගේ බැටළුපැටවෙක් ලෙස" ජිවිතය පුජාකල හැකි විය. (යොහාන් 1: 29)

වෙනත් වචනයකින් කිවහොත් ස්වේච්ඡාවෙන්ම ලෝකය පවෙන් මිදීමට ඔහු කුරුසිය මත දිවිපිදුවේ පාපයවෙනුවෙන් පුජාවක් ලෙසය. මනුෂ්‍යත්වයේ නියෝජිතයෙකු ලෙස ඔහු "දෙවියන්ගේ ධර්මිෂ්ඨ විනිශ්චය දරා", "පාපය විනාශ කලේය." වැඩි දුරටත් පරීක්ෂාවට නැඹුරුවක් ඇති "මාංශයේදී" ඔහු විසින් පාපය විනාශ කරන ලදි. මෙසේ ඔහු ඔහුගේ ජිවිතය "පාපයට පුජාවක්" (රෝම 8:3) කරන ලදි. යේසුස් ඔහුගේ පාපය නොමැතිකමින්, දෙවියන් විසින් ධර්මිෂ්ඨව මරණයෙන් සදාකල් ජිවිතයට සහ බලයට නැගිටවනු ලබන්නට හැකි විය.

එසේම මෙය අපට උපකාරිවන්නේ කෙසේද? අප මේ පාපි මංශයේ ජිවිතයේ සිටිනා තුරා අපට එවන් සම්පූර්ණ ජිවිතයක් කිසිදිනක ගත කල නොහැක.

## දෙවියන් වහන්සේගේ නියමයන්

පිළිතුර හාස්කමකින් සිදුවන දෙයක් මත පිහිටුවා නැත. අප ඔහුගේ පුත්‍රයා විශ්වාස කරමුයි කී පමණින් දෙවියන් වහන්සේ ඉබේටම අපේ තත්වය වෙනස් නොකරනු ඇත. ඔහුගේ පුත්‍රයාගේ ජිවිත පුජාව නිසා ගුප්ත මාර්ගයකින් අප පව්න් තොර ලෙස දෙවියන් වහනසේ ගණන් ගන්නේ ද

නැත. එය සිදුවන්නේ එක්තරා කොන්දේසි ප්‍රමාණයක් මත හා ඔහුගේ කාරුණික ප්‍රේමවන්තභාවය නිසාය. ප්‍රධාන කොන්දේසිය වන්නේ ස්ත්‍රීන් හා පුරුෂයින් යේසුස් වහන්සේ මගින් ඔහුවෙත ඒමට ඔවුන් පිළිබඳ සත්‍ය වටහා ගත යුතු අතර පාපය සඳහා යේසුස් වහන්සේ කුරුසිය මත දිවිපිදූ අයුරු සැලකිය යුතුය. අනතුරුව ඔවුන් ඔවුන්ගේ ස්වභාවික සිතුම් පැතුම් අනුව ආත්ම තෘප්තියට කටයුතු කරනවා වෙනුවට "කරුණාව සහ සත්‍ය වූ" යේසුස් වහන්සේගේ ජිවිතය අනුව කටයුතු කල යුතුය.

ඉන්පසුව දෙවියන් වහන්සේ "අපගේ චෝදනා කිරීම අවලංගු කර" ඔහු සමඟ නියම සම්බන්ධතාවයක් ඇති කරගනු ඇත. මෙයින් පමණක් ඔහු අප ඔහුගේ "දූපුතුන්" ලෙස සලකනු ලබන අතර ඔහුගේ එකම පුත්‍ර යේසුස් වහන්සේ ප්‍රධානියා වූ ඔහුගේ පවුලේ සාමාජිකයන් සේ සලකනු ඇත.

## පසු තැවීම හා හැරී ඒම

අපට දැන් බයිබල් ප්‍රකාශ දෙකක් වඩා හොඳින් අවබෝධකර ගත හැක. මේ දෙකම යේසුස් වහන්සේගේ ස්වර්ගයට ඔසවාගත් සුළුකලට පසුව අපෝස්තුළු පේදුරුතුමා යෙරුසෙලමේ වැසියන්ට කී දේවල්ය.

"නුඹලාගේ පාපයන් මකාදමනු ලබන පිණිසද, මනස්තාපව හැසිරෙන්න." (ක්‍රියා: 3:19)

ඒනිසා අද කාලයේ "පසු තැවීම" හා "හැරී ඒම" යන වැදගත් කරුණු දෙක වැරදි ලෙස භාවිතා කිරීම ඉමහත් කණගාටුවකි. සත්‍ය පසුතැවීම නම් "සිතේ වෙනසක් ඇති කිරීමයි. එය අවබෝධ කිරීමකි. "සිතේ වෙනසක් ඇති කිරීම කුමක් ගැනද," අප විමසන විට අප දැනටමත් කථාකල දේවල් වලින් පිලිතුර පැහැදිලිවේ. එය අප අපි ගැන සිතවෙනස් කර ගැනීම පිළිබඳවයි. දෙවියන් වහන්සේ පව්කාර අපහට බයිබලයේ පෙන්වා ඇතිලෙස අපේ දුබල කම් තේරුම් ගෙන ජිවත් විමයි.

ඉන්පසු "ආපසු හැරී ඒම" පිළිබඳ අණ කිරීම ඊළඟ පියවරයි. මෙහි මූලික අදහස වනුයේ "ආපසු හැරී විරුද්ධ දිශාවට යන්න"යි. මෙය පසුතැවීම් ප්‍රායෝගික ප්‍රථිඵලයේ සත්‍යයයි" එය අපේ ජිවිත නැවතයොමුකල යුතු අයුරු අවබෝධ කරගැනීම හා දෙවියන් වහන්සේගේ කැමැත්තට හා වඩාත් යුතුදුව යේසුස් වහන්සේගේ අණ කිරීම් පිළිගැනීමය.

නමුත් පේදුරු යෙරුසලමේ වැසියන්ට වැඩිදුරටත් මේ පණිවිඩය ඉහල තත්වයකින් දක්වමින් "පව් සමාව ලබන පිණිස ඔබ සියල්ලන් පසු

තැවී යේසුස් වහන්සේගේ නාමයට <u>බෞතිස්ම වන්න</u>" (ක්‍රියා 2:38) යයි කියයි.

පේදුරු ඔවුන්ට බෞතිස්ම වීමට අණකලේ ඇයිද, යන්න වඩාත් පැහැදිලි වන්නේ යේසුස් වහන්සේ හා අපෝස්තුලුවරුන්ගේ කාලයේ බෞතිස්මය සම්පූර්ණයෙන්ම දියේ ගිලීමක් වූ හෙයිනි. ඇත්තෙන්ම එහි අදහස වූයේ කුමක්ද, යන්න අපෝස්තුලු පාවුල් රෝමවාසීන්ට ලියූ ඔහුලේ ලිපියේ ඔබ තේරුම් ගනු ඇත. ඔහු කියන්නේ,

"ක්‍රිස්තුස් වහන්සේගේ බෞතිස්මය ලැබූවා වූ අප සියල්ලන් උන් වහන්සේගේ <u>මරණය තුලට</u> බෞතිස්මය ලැබූ බව නුඹලා නොදැන සිටින්නාහුද? එනිසා අපට බෞතිස්මය තුලින් අප උන්වහන්සේ සමඟ මරණය තුලට වලලනු ලැබූවාහු වෙමු." (රෝම6:3-4) නැතිනම් ඔහු කොලොස්සිවරුනට ලියූ ලෙශ ,

"බෞතිස්මයත් ඔහු සමඟ <u>වලලනු</u> ලැබූවන්ට" (2:12)

ඇත්තෙන්ම වලලනු ලබන්නේ මිය ගියාහු පමණි. ජීවතුන් අතර සිටින්නන් වලලත්දැ? ඇත්තෙන්ම පාවුල් කියන්නේ මෙයයි. ඔහු කොලොස්සි විස්වාසිකයින්ට සිහිකරන්නේ ඔවුන්ගේ සුභාරංචිය පැමිණීමට පෙර ඔවුන්ගේ ස්වාභාවික තත්වයයි.

"ඔබලා ඔබේ මංශයේ ආචර්මඡේදකව පාපයේ මියගියාහුය." (13 පදය)

## <u>වැලලී ............... නැගීටීම</u>

ඔහුගේ අදහස පැහැදිලිය. ඔවුහු දෙවියන් වහන්සේ ඉදිරියේ මිය ගියාහු වැනිය. ඔවුන්ගේ මාංශයේ ස්වභාවය ආශාවන් විසින් පාලනය කරනු ලැබූවාහුය. ඔවුනට මරණය හැර "බලාපොරොත්තුවක්" නොවීය. ඔවුන්ට තමන් ගැන මේ සත්‍ය එතතු ගැනීමමට අවශ්‍ය විය. දිය යට යාම, පාපය සඳහා දෙවියන් වහන්සේ දෙන ධර්මිෂ්ඨ දඬුවමේ සලකුණක් යැයිද, මේ තමන්ගේ මරණය යයි අවබෝධ කර ගැනීමක් ද වශයෙනි. ඇත්තෙන්ම ඵලයට ඔවුන් නව ජීවන බලාපොරොත්තු සහිතව දියෙන් නැගී සිටිනු ඇත. "ක්‍රිස්තුස් වහන්සේ පියාණනයේ මහිමය කරන කොට ගෙන මලවුන්ගෙන් නැගිටවනු ලැබූවා සේම අපද ජිවිතයේ අළුත්කමෙන් හැසිරිය යුතුය. (රෝම 6:4) හෝ ඔහු කොලොස්සිවරුනට කීසේ,

"නුඹලා බෞතිස්මය කරනකොටගෙන උන්වහන්සේ සමඟ වළලනු ලැබුවාහු උන්වහන්සේ සමඟ නැගිටවනු ලැබුවාහුද වෙති" (2:12)

මේ සමාන්තරය පැහැදිලිය. යේසුස් වහන්සේ අමරණීය ස්වභාවයේ අළුත් ක්‍රමයට ජීවිතයක් සඳහා මරණයෙන් නැගිටුවන්නාක් මෙන් ඔහු කෙරෙහි විශ්වාසිකයා ජලයෙන් අළුත් ජීවිතයකට බෞතිස්මය තුලින් නැගිටින්නාහුය. විශ්වාසිකයා පෙරසේම ශාරීරික ස්වභාවයෙන් යුතු වුවද ඔහුගේ බාහිර ජීවන දර්ශණය වෙනස් වී ඇත. ඔහු අවබෝධ කර ගන්නේ, ඔහු තමාගේ ස්වාභාවික ආශාවන් තෘප්තිමත් කිරීමට පමණක් ජීවත් වන්නේ නම් ඔහු සදාකාලික මරණයෙන් අවසන් වේය යන්නයි. ඔහු සතුව පවතින අළුත් අරමුණ නම් දෙවියන් වහන්සේගේ කැමැත්ත හා යේසුස් වහන්සේගේ අණ කිරීමය.

යේසුස් වහන්සේ නිකදේමුස්ට කථා කරන විට අදහස් කළේ මෙය වේ. "ඔබ නැවත ඉපදිය යුතුය." (යොහාන් 3:7) අපෝස්තුලු පාවුල් මෙහි ප්‍රායෝගික අදහස කියයි.

"ඔබගේ තෘෂ්ණා වලට අවනත නොවන ලෙස මින්මතු ඔබගේ මැරෙන සුළු ශරීරයෙහි පාපය රජකම් නොකෙරේවා" තවද ඔබගේ ඉන්ද්‍රියන් අධර්මිෂ්ඨකමේ ආයුධ කොට පාපයට භාර නොදී ......... පාපය නුඹලා කෙරෙහි අධිපතිකම් නොකරන්නේය." (රෝම 6: 12-14)

වෙනත් වචනයකින් කිවහොත් ඔබ ඔබේ ස්වාභාවික ආශාවන්ට ඔබව පාලනය කිරීමට ඉඩ නොදිය යුතුය. එයින් ඔබව එක් විදිහක වහල්කමකට ගෙනේ" ඔහු තවත් කියනුයේ ,

"මළවුන් කෙරෙන් උත්ථාන වූ අය මෙන් දෙවියන් වහන්සේට කැප වී....."

"දෙවියන් වහන්සේට යටත් වන්න. යම් සේ මරණයෙන් ජීවිතය ලද්දවුන් මෙන්" ( 13 පදය)

මෙසේ දයාබර විශ්වාසිකයා තම ස්වාමියා මාරුකර ඇත. හේතුව ඔහු බයිබල් දැනුමෙන් ස්වකීය "සිත වෙනස් කර ඇත" ඔහුට නව ජීවිතයක් ඇත්තේ ඔහුගේ ජීවන දර්ශණය අළුත් නිසාය. මේ ඔහු "නැවත උපන් අයුරුය." අපොස්තුලුවරයා මෙය පෙන්වන්නේ වෙනස් පුද්ගලයෙකු වීම වශයෙනි.

"නුඹලාගේ ජීවිතයේ පළමු හැසිරීම ලෙස....... පරණ මනුෂ්‍යයා පහකර දමන්න....... නුඹලාගේ චිත්තාත්මයෙන් අලුත් කරනු ලැබ........ අලුත් මනුෂ්‍යයා පැළඳගන්න." (එපීස 4:22-24)

"උන්වහන්සේ සියල්ලන් වෙනුවෙන් දිවි පිදුවේ ජීවත් වන්නන් තවත් තමන්ම උදෙසා ජීවත් නොවී, ඔවුන් වෙනුවෙන් මැරී නැවත නැගිටුනාවූ තැනන්වහන්සේ උදෙසා ජීවත් වන පිණිසය............. යමෙක් ක්‍රිස්තුස්වහන්සේ තුළ සිටින්නේ නම් ඔහු අලුත් මැවිලක්ය." (2 කොරින්ති 5:15, 17)

## අළුත් ජීවිතයක්

මෙසේ බයබලය තුල දී ඇති බෞතිස්මය වනාහි වඩාත් සැලකිය යතු කරුණකි. මේ ක්‍රමයෙන් විශ්වාසිකයා තම මරණයෙන් ගැලවීම අවශ්‍ය බව වටහා ගනී. ඒ මොහොතේම ඔහු තමා ක්‍රිස්තුස් වහන්සේගේ ආත්මය තුල ජීවත් වියයුතු බව සලකයි. ඔහු දෙවියන් වහන්සේ තමන් ඔහුගේ පුතෙකු සේ සලකනු ඇතැයි විශ්වාසයෙන් අළුත් ජීවිත පාඩමාලවක් ආරම්භකරයි. මේ සියල්ල දින කිහිපයක් වියැති බිළිඳෙකු විසින් කල නොහැක. දරුවෙකුට සාමන්‍යයෙන් යමක් අවබෝධ කර ගැනීම හෝ වගකීමට නොහැකිය. ඔහු වෙනුවට වෙනත් වගකියන්නෙකු "පෙනීසිටීය" නොහැක. ශුද්ධ ලියවිලි වල එවැනි වගකියන්නන් භාර නොගැනේ" "ඔබ.......ඔබේ ගැලවීම සලසාගන්න." (පිලිප්පි 2:12) අප වෙනුවෙන් වෙනත් කිසි කෙනෙකුට එය කල නොහැක.

බිළිඳුන් බෞතිස්ම කිරීම පිළිබඳ, නව ගිවිසුමේ නිදසුන් නැත්තේ මේ නිසාය. ඔවුහු සියල්ලෝම තමන් කලේ කුමක් දැයි සම්පූර්ණ අවබෝධයකින් යුතු වැඩිහිටියෝ වූහ. මුල් සභා ලියවිලි වල ක්‍රි.ව. 150 වනතුරු බිළිඳුන් බෞතිස්ම කිරීම පිළිබඳ, සටහන් නැත" ජස්ටින් මාටියර් (ඔහු ක්‍රි.ව. 165 දී මිය ගියේය.) පැහැදිලිවම ඔහුගේ කරුණු වල වැඩිහිටියන්ට කියන්නේ,

"අප කියන්නේ සහ උගන්වන්නේ සත්‍ය බව විශ්වාස කර පසුපස පැමිණෙන ඒ අනුව ජීවත් වීමට කැමැත්තෙන් සිටින බෝහෝ දෙනාට යාඥා කිරීමට උපදෙස් දී.......... ඔවුන්ගේ පව් සමාව සඳහා.............., (අප) තෝරා ගත් සහ දැනුමේ දරුවන් වන අතර ජලයෙන් පව් සමාව ලැබ .................. (විශ්වාසිකයා) නැවත ඉපදීම තොරාගෙන ඔහුගේ පාපයන් ගැන පසුතැවී (ඇන්ටි නිසෙන් ක්‍රිස්ටියන් ලයිබ්‍රරි වෙළුම ii පි 59)

ටර්ටුලියන් (ක්‍රි.ව. 200 පමණ) බිළිඳු බෞතිස්මය සඳහන් කල ප්‍රථම පුද්ගලයා ලෙස ඉතිහාස ගත වී ඇත. අපෝස්තලික චාරිත්‍ර චාරිත්‍ර පවත්වාගෙන ආ පුද්ගලයා ලෙස ඔහු ජනප්‍රිය වී ඇත. ඔහු වැඩිවී එන ළමා බෞතිස්මයට එරෙහිව ලිව්ය. ඔහු එහි "මහත් විරුද්ධවාදියෙක්" වූ බව නියැන්ඩර් නම් ඉතිහාසකරු කියයි. (පල්ලියේ ඉතිහාසය වෙළුම 1 පි 425)

## <u>ශුද්ධ ලියවිලි වලට එරෙහි ළදරු බෞතීස්මය</u>

එතැන් පටන් සියවස් ගණනක්, විශේෂයෙන් 16 වැනි සියවසේ බයිබලය ඉගැන්වීම පිළිබඳ අළුත් උනන්දුවක් ඇති වූ ප්‍රතිසංස්කරණයේදී, ළදරු බෞතීස්මය පිළිබඳ ක්‍රියාවලිය විවාදයට ලක්විය. මේ ක්‍රියාව සාධාරණීකරණය කලේ කතෝලික සභාවයි. එය ඒ සභාවේ චාරිත්‍රය නිසයි. මෙය පිළගත නොහැකි හේතුවකි. අනෙකුත් සභාවල් මෙම පුරුද්ද සාධාරණීය කරණය කරන්නේ, මේ සක්‍රමේන්තුව තුලින් දරුවා විනාශයෙන් ගැලවී "ශුද්ධාත්මයෙන් නව ජීවනයක්" ලබාගන්නේ යැයි කියමිනි. ඔවුන් මෙයට "සක්‍රමේන්තු පුනර්ජීවනය" කියා කියති. මේ උගැන්වීම ශුද්ධ ලියවිලි වලින් යුක්ති සහගත කල නොහැකිවා මෙන්ම එය බයිබලයේ උගන්වන බෞතිස්මය ද, නොවී "උත්සවයකින් ගැලවීම ලැබීම" නොවේ. ප්‍රධාන ජර්මන් ආගම් වාදියෙකුවන දොස්තර එල්. ලැන්ග් අවංකව කීවේ

"අපක්ෂපාතීව ශුද්ධ ලියවිලි කියවන සියල්ලන් සැලිකිය යුත්තේ පුරාණ ක්‍රිස්තියානි යුගවල <u>ළමා බෞතිස්මය පිළබඳ මුල් ක්‍රිස්තියානීන්ට දැනීමක් නොවීය</u> යනුවෙනි. (ප්‍රොතෙස්තානික ඉතිහාසය 221 පිටුව)

වෙනත් ලිපයක ඩීන් ස්ටැන්ලි මෙසේ ලියයි.

"දියේ ගිල්වාලන චාරිත්‍රය, අපෝස්තලික හෝ ප්‍රාථමික වුවත්, ....... බටහිර සහ උතුරට තම රසඥතාවය, පහසුව සහ හැඟීමට සුදුසු නොවීය. සංගායනා නීතියකින් නොවුවත්, ක්‍රිස්තියානි නිදහස තුළින් මෙම මහත් වෙනස (ළදරුවන්ට දිය ඉසීම) සිදු කරන ලදී. චාරිත්‍ර සහ සම්ප්‍රදාය පරදවා ව්‍යවහාරික ඥානයේ ජයග්‍රහණයට මෙය කදිම නිදසුනකි." (දහනව වැනි සියවසේ විචාරය, ඔක්. 1879)

වෙනත් වචන වලින් පල්ලිය අත්තවාදිව අපෝස්තුළු වරු හා යේසුස් වහන්සේ විසින් ශුද්ධ ලියවිලි ප්‍රකාර කියපු දේ වෙනස් කලේ එය අපහසු පිළිගත නොහැකි තිරස එකක් වූ නිසාය.

## <u>දෙගිඩියාවන්</u>

අප මෙතරම් වේලා කථාකල තරමක් සාමාන්‍ය වූ ප්‍රතික්‍රියා මෙහි අඩු තරමින් දෙකක් වත් කල්පනා කිරීමට සුදුසුව තිබේ. පළමුව "මෙය සම්පූර්ණ සත්‍ය යයි මම පිළිගනිමි. නමුත් මට බෞතිස්මය අයදින්නට නොසිතේ." යයි කියන්නෝ ඇත. මේ තත්වය මූලිකව පැන නගින්නේ ප්‍රධාන වශයෙන් ආගමකට මහත් උද්යෝගයක් හැඟීමක් තුළ ඇති වනු දැකීමට

පුළුවන් වන අයටය. අනෙක් අය එක්තරා ප්‍රමාණයකට පෞද්ගලිකව වගකීමක් ඇත්නම් ඔවුන් තවමත් බෞතිස්මයට සුදුසුව නොසිටි බව ඔවුනට වැටහෙනු ඇත.

නමුත් මෙය වරදවා වටහා ගැනීමකි. පළමුකොටම දෙවියන් වහන්සේ අප ගැන අදහස් කරන්නේ අප ඔහුගේ වචනය තෙරුම් ගැනීමට අපේ සිත් යොමු කිරීමය. ඊලඟට ඔහු විසින් එහි යොදා ඇති සත්‍ය පිළිගැනීමටය. ඉන්පසුව ඔහුට සේවය කිරීමට උත්සාහ කිරීමට කල්පනා කිරීමටය. දේව වචනය පිලිබඳ මෙබඳු වෙනස් නොවන ක්‍රමයක් ඇයිද යන්න වැදගත් කරුණකි. එක්තරා වැදගත් සත්‍යයක් අවබෝධ කරගන්නා මිනිස් ඒවා තම ජිවිතයට බලපාන ලෙස සකස් වී වෙනස් මිනිසෙක් බවට පත්වේ. ඔහු නොවෙනස්ව මේකරුණෙහිලා පවති නම්, ඔහු වෙනස් චරිතයක් බවට පත් වනුයේ ඔහු තම මනස අළුත් කරමිනියි" පාවුල් කී ලෙසය. මේ වෙනස සදාකාල වේ. දෙවියන් වහන්සේ මේ අළුත් පුද්ගලයා දැන් සහ එන්නාවූ කාලයේ තම සේවයට යොදාගනු ඇත.

## දෙවියන් වහනසේගේ අණ

අවසානයේ දී ඉදින් අප බෞතිස්ම විය යුතු බවට දෙවියන් වහන්සේගේ අණ බව දනී නම් අප එයට කීකරු විය යුතුය. නොඑසේ නම් අප දේව වචනය සහමුලින්ම ප්‍රතික්ෂේප කරන්නෝ වෙමු. ගැඹුරින් අප අගය කල දේ පසුව නැවත ආපසු එන්නේ අප කෙරෙහි දෙවියන් වහන්සේ දක්වන ආකල්පය සහ "ඔහුගේ දයාවේ ධනය" (එපිස 1:7) තුලින් ඒවාට සමාව දීමය. නමුත් අත්‍යාවශ්‍ය පලමු පියවර වන්නේ අප ඔහුගේ වචන ඉදිරියේ බැගෑපත්ව ඔහුගේ වචනය කියන ලෙස කිරීමය.

දෙවැනුව මෙසේ කියන සමහරු සිටිය හැක. "මේ සියල්ල සත්‍ය යයි මම එකඟවෙමි. නමුත් මට මෙලෙස ජිවත් විය නොහැකියි" අඟවමින් එහෙයින් ඔහුට එය අවශ්‍ය නොවන බව පවසයි. ඇත්තෙන්ම අපි අවංක වෙමු නම් මෙය සමාව ලැබිය හැකි කරුණක් නොවේ. මෙය පැහැදිලි අණ කිරීමක් මඟ හැරීමකි. ඉදින් පුද්ගලයා මෙසේ කියමින් ශුද්ධ ලියවිලි සත්‍ය බෞතිස්ම ගැන පිළිගනිද, ඔහු සාමාන්‍යයෙන් දේව කැමැත්ත ප්‍රතික්ෂේප කරන්නෙකි.

නමුත් ඔහු, ජිවිතය සත්‍ය කරුණාව හා යේසුස් වහන්සේගේ ශුද්ධවන්ත කම සිතැතිව උන් වහන්සේ අනුගමනය කිරීම දුෂ්කර බැවි කල්පනා කරනු විය හැක. මෙසේ ඔහු විනාශයට යනු ඇත. නමුත් මෙහි බරපතල වරදවා ගැනීමක් පදනම්ව ඇත. එය දෙවියන් වහන්සේ අප

පිරිසිදු ජීවිතයක් ගත කිරීම බලාපොරොත්තුවේ යන අදහසයි. දෙවියන් වහන්සේ අපේ දුබල ස්වභාවයෙන් ගැන මනා අවබෝධයෙනි. ගීතිවලි කර්තෘ එය මනාව පෙන්වා ඇත. (ගීතාවලි 103)

"පොළොවට ඉහලින් අහස උස්ව තිබෙන්නා මෙන් උන් වහන්සේ කෙරෙහි භය ඇත්තන්ට උන්වහන්සේගේ කරුණාව මහත්ය. (ගෞරව සහිතව වන්දනා කිරීම)....... පියෙක් තම දරුවන්ට අනුකම්පා කරන්නා මෙන් තමන් කෙරහි භය ඇත්තන්ට උන් වහන්සේ අනුකම්පා කරන සේක. මක් නිසාද, උන්වහන්සේ අපේ ස්වභාවය දන්නා සේක. අප දූවිලි බව සිහිකරන සේක." (11-14 පද)

අප කටයුතු කරන්නේ නිසල ආඥාදායකයෙකු සමග නොවේ කරුණාවන්ත පියෙකු සමගය. ඔහු එක් අයෙකු හෝ විනාශ වනු දැකීමට කැමති නැත. "සියලු මනුෂ්‍යයන්ගෙන් මිදීමත්, ඔවුන් සත්‍යය දැන ගැනීමත් දෙවියන් වහනසේගේ කැමත්තය" කිසිවෙකු විනාශවීම ඔහුගේ කැමැත්ත නොවන බව......." (තිමොති 2:4,2 පීටර් 3 : 9) කෙටියෙන් ඔහු පශ්චාත්පය වන අයගේ දුබලකම් වලට සමාව දීමටද, ඔහු ගලවා ගැනීමට ද මහත් උනන්දුවෙන් කැමතිව සිටියි. ඔවුන් දිරිමත් කරීම සඳහා යේසුස් වහන්සේ ඔවුන් වෙනුවෙන් මැදිහත්ව කථාකිරීමට පියාගේ දකුණුපස සිටියි.

අප දෙවියන් වහන්සේගේ කරුණාව ගැන විශ්වාස කර ඔහුගේ අණ කිරීම් වලට කීකරු විය යුතුය. ඒ සඳහා පළමු ඒකාන්ත පියවර බෞතිස්මයයි.

## වරප්‍රසාදය

අපගේ බෞතිස්මය වනාහි අප වෙනුවෙන් දෙවියන් වහන්සේගේ කැමැත්ත එළිදරව්කල සත්‍ය පිළිගැනීමේ හා තෙරුම් ගැනීමේ සලකුනකි. එය අපට අළුත් ජීවන ක්‍රමයක් විවෘත කර දෙයි. අපේම පෞද්ගලික ජීවිතය ගැන අළුත් මාර්ගයකි. කරදරකාරී අසංවර ලෝකයෙන් මිදීමට අළුත් මාවතකි. ජීවිතය පිළිබඳ, වැදගත් තීරණ ගැනීමට අළුත් විදිහේ ශක්තියකි. දෙවියන් වහන්සේ සමඟ සාමයට අළුත් දර්ශණයකි. ජේසුස් වහන්සේ තුලින් නැවත ඔහු වෙත සම්බන්ධ කිරීමකි. අප සුභආරංචිය විශ්වාස කල විට අපගේ තත්වය වෙනස් වේ. අප තව දුරටත් අපේ පාපයන් නිසා දෙවියන්ගෙන් ඈත් නොවේ. ඔහුට දැකීමට ප්‍රිය ඔහුගේ දූපුතුන් වෙති. යේසුස් වහන්සේ පැමිණි විට මහපොළොව මත පිහිටුවන දේව රාජ්‍යයේ කොටස් කරුවෝ වෙමු.

එය මහත් විශ්මය ජනක අයිතිවාසිකමකි" අපි එය නොසලකා ඉවත දැමිය යුතු නැත්තෙමු.

- ෆ්‍රෙඩ් පියර්ස් -

<u>**බෞතීස්මය - ප්‍රශ්න**</u>

1. යේසුස්වහන්සේ 'මිනිසෙකු ජලයෙන් ඉපදිය යුතුයැ' යි කිව්ව, එතුමා අදහස් කලේ කුමක්ද? ඔබගේ පිළිතුරු සනාථ කිරීමට දෙන බයිබල් පද මොනවාද?

2. 'යහපත් ජීවිතයක් ගත කිරීම' හෝ 'මගේ පෞද්ගලික ගැළවුම්කාරයාණන් ලෙස යේසුස්වහන්සේ පිළිගැනීම' පමණක් නොසෑහෙන බැව් පෙන්වීමට උදාහරණ මොනවාද?

3. බෞතීස්මය යනු කුමක්ද? ළදරුවන්ට දිය ඉසීම බයිබල් බෞතීස්මයද? එසේ නොවන්නේ ඇයි?

4. බෞතීස්මය සංකේතවත් කරන්නේ කුමක්ද? (රෝම. 6 කියවන්න)

5. බෞතීස්මයෙන් පසු දෙවියන්වහන්සේට අපගේ ඇති සම්බන්ධතාවය වෙනස් වන්නේ කෙසේද?

6. අපගේ පාපයන්ට සමාව ලැබෙන්නේ කෙසේද?

7. මනස්තාපය යනු කුමක්ද? පාපය යනු කුමක්ද?

8. දෙවියන්වහන්සේට ප්‍රසන්න වීමට නම් බෞතීස්මය පසු පස පැමිණිය යුත්තේ කුමක්ද?

9. 1 පේත්‍රුස් 3 පරිච්ඡේදයේ 20 සහ 21 පද කියවන්න. මෙම පද හඟවන්නේ කුමක්දැයි ඔබට සිතෙන ලෙස ඔබගේ වචනයෙන් ලියන්න.